# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2338/57 - 2023 ජූනි මස 30 වැනි සිකුරාදා - 2023.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 02/2023 දරන සුරාබදු නිවේදනය

**මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, 2023 ජූලි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි;

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ විශේෂ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හයදහසක් (රු. 6,000.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම්කළ අරක්කු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හයදහස් හාරසිය විස්සක් (රු. 6,420.00) වන බද්දක් අය විය යුතු යැයි ද ;

(3) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ "විදේශීය" ස්ප්‍රීතු මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හයදහස් හයසියයක් (රු. 6,600.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

(4) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට පහක් (5%) සහ ඊට අඩු වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/ නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් හාරදහස් හත්සිය පනහක් (රු. 4,750.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

(5) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට පහකට (5%) වඩා වැඩි වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/ නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් හාරදහස් නවසිය අසූවක් (රු. 4,980.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

1A - PG 6401 — 456 (2023/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(6) රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණුකොට තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑම පැළෑටියකින් ලබා ගන්නා ස්වභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් හාරදහස් හත්සිය පනහක් (රු. 4,750.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

(7) මධ්‍යසාර ප්‍රතිශතය 18%ට අඩු දේශීය ශාක ද්‍රව්‍ය හෝ ශාක නිෂ්පාදන හෝ දේශීය පානීය සත්ත්ව කිරි මඟින් හෝ පමණක් ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ මත්පැන් සඳහා මධ්‍යසාර සෑම ලීටරයකටම රුපියල් එක්දහස් තුන්සියයක් (රු. 1,300.00) වන බද්දක් අය විය යුතු යැයි ද;

(8) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ කිරි පොන්සා මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් තුන්දහස් තුන්සියයක් (රු. 3,300.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

(9) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ සයිඩර් ලේබලයේ සඳහන් නිරපේක්ෂ සැර සියයට හතරකට (4%) නොවැඩි මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් තුන්දහස් හයසියයක් (රු. 3,600.00) වන බද්දක් අයවිය යුතු යැයි ද;

(10) ඉහත (1) සිට (9) දක්වා නිශ්චිතව සඳහන් කර ඇති බද්ද, අපනයනය කරනු ලබන මත්පැන් කවර ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුව ද එකී බද්ද අය නොකළ යුතු යැයි ද;

(11) ඉහත අයිතම (4) සහ (5) යටතේ නිශ්චිතව සඳහන් කර ඇති බද්ද, යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද මත්පැන් ඕනෑම ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද;

2022 දෙසැම්බර් 31 දිනැති අංක 2312/70 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 07/2022 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද, නියම කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජුනි මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 07 - 0203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.